# යටත් විජිතකරණය සහ බෞද්ධ සැරසිලි කලාව (ක්‍රි.ව.1750-1900)

*(Colonization and Decorative Motifs of Buddhist Art -1750-1900 A.D.)*


ජේ.ඒ.වී.එන්. ජයතිලක

ඉතිහාස සහ කලා සිද්ධාන්ත අධ්‍යනාංශය

දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

J.A. V. N. Jayathilake, Department of History & Art Theory,

Visual & Performing Arts University, Sri Lanka

vajiranalinda7@yahoo.com



## සංක්ෂේපය

ශ්‍රී ලංකාව යුරෝපීය යටත්විජිතකාරක ග්‍රහණයට නතු වීමේ ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ සැරසිලි කලාවේ වැදගත් වෙනස්කම් රැසක් සිදු විය. විශේෂයෙන් ම ලන්දේසි හා ඉංග්‍රීසි කාල පරිච්ඡේදයන්හි පහතරට වෙරළබඩ තීරයේ ඉදි වූ විහාරස්ථානවලින් මෙම ලක්‍ෂණය හොඳින් ප්‍රකට වේ. සාම්ප්‍රදායික මධ්‍යම මහනුවර ගුරුකුලයේ (උඩරට බෞද්ධ කලාවේ) ප්‍රචලිත ලියවැල්, නෙලුම් මල්, පලා-පෙති, සපුමල්, කඩුපුල් මල් ආදී මෝස්තරාංග වෙනුවට මිදිවැල්, මිදි-පොකුරු, රෝස-මල්, සහ බැරොක-රොකෝකෝ වැනි අපරදිග මූලයන් සහිත සැරසිලි රැසක් පහතරට බෞද්ධ කලාවට එක් විය. එසේ ම නව සැරසිලිමය රූප වන කඟවේණා, සමනලයින්, කෘමි-සතුන්, අනංග රූප, ස්වාභාවිකරූපී පක්ෂීන් හා සතුන් ආදීන් බෞද්ධ සැරසිලි කලාවට පැමිණ තිබේ. වා-කවුළු මෙන් ම සිතුවම්වල පසුබිම්-අවකාශ පිරවීමට බැරොක-රොකෝකෝ සම්ප්‍රදායේ පත්‍රරටා මෝස්තර යෙදීම, යුරෝපීය රාජ්‍ය ලාඤ්ඡන දොරටු සැරසිල්ලක් ලෙස යෙදීම, රංජිත-වීදුරු අලංකරණය, පිඟන් ගඩොල් සහ මොසෙක් සැරසිලි කලාව, ඉංග්‍රීසි පාඨ සැරසිලිමය අරුතින් භාවිතය ආදිය බෞද්ධ සැරසිලිකරණයට පිවිසිණි. බෞද්ධ සැරසිලි කලාවේ ස්වරූපය වෙනස් වීමට ස්වදේශීය ශිල්පීය පුහුණුව වෙනස් වීම, සිංහල රාජ්‍ය අනුග්‍රහය අහිමිවීම, කොට්ටල්බද්ද බිඳවැටීම, කොම්ප්‍රදෝරු-ප්‍රාන්තික අනුග්‍රාහකත්වය, අපරදිග දැනුම පැතිරයාම, යටත්විජිතකාරකයන් දේශීය සැරසිලි නොසලකා හැරීම, අපරදිග සැරසිලි සහිත ගොඩනැගිලි තැනීම, විදේශීය සිත්තරුන් පැමිණීම සහ අපරදිග ව්‍යවහාරික කලා පැතිරීයාම ආදිය හේතු වූ බව හඳුනා-ගත හැකිය.



**මූල පදඃ** දෘශ්‍ය කලාව/ යටත්විජිත සමය/ පහතරට විහාරස්ථාන/බෞද්ධ කලාව/ සැරසිලි කලාව

# ***Colonization and Decorative Motifs of Buddhist Art (1750-1900)***

### ***Abstract***

Western colonization has resulted in a considerable change in decorative motifs of Buddhist art, particularly in the late Dutch and British colonial periods. A large number of Western inspired decorative motifs such as grapevine designs, roses, foliage motifs inspired by Baroque or Rococo styles have been predominantly used in the Low country temples instead of traditional motifs of Kandyan School such as lotus, *liyawela, supu, palāpethi* etc. In addition, new decorative figures like unicorns, butterflies, humming birds, cherubs, insects, etc., were found in Buddhist art. Furthermore, colonial coat of arms decorations, mosaic techniques, tinted glass, Latin typography styles have become a practice in Buddhist temples. It is possible to notice that the changes of traditional training of native artisans, losing of Kandyan patronage, collapsing of *kottalbadda*, emergence of new group of patrons from compradore class, Euro-centric knowledge, ignorance of traditional designs, expansion of Western applied arts and promoting Western values by colonizer, etc., have influenced the making of such changes in Buddhist art.

***Keywords:*** Visual Art, Colonial Period, Low-country temples, Buddhist Art, Decorative motifs

ක්‍රි. ව. 1750-1900 ත් අතර කාල පරිච්ඡේදය ශ්‍රී ලාංකේය ඉතිහාසයේ අපරදිග යටත් විජිතකාරක බලපෑම දේශපාලනික සහ සමාජීය වශයෙන් ප්‍රබල ව සිදු වූ සංකීර්ණ මෙන් ම තීරණාත්මක කාල පරිච්ඡේදයකි. ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය පෘතුගීසි (1505-1658), ලන්දේසි (1658-1796), සහ ඉංග්‍රීසි (1796-1948) යන අපරදිග යටත් විජිතකාරක ග්‍රහණයට නතු වීමේ ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ සැරසිලි කලාවේ වැදගත් වෙනස්කම් රැසක් එම ප්‍රදේශවල සිදු වූ අතර, එයින් ද ලන්දේසි සහ ඉංග්‍රීසි කාල පරිච්ඡේද ඉතා වැදගත් වේ. ආගමික සහ දේශපාලනික වශයෙන් අපරදිග යටත් විජිතකරණය සනිටුහන් කරනුයේ බෞද්ධාගමට ප්‍රතිවිරුද්ධ පිහිටීමකි (Abeysinghe 1995: 124-133; de Silva 1995 : 87,93; Kotalawala 1995: 240, බෞද්ධ තොරතුරු පරීක්ෂක වාර්තාවඃ (1956). මේ නිසා යටත් විජිතකරණය විසින් ස්ථාපිත කළ සැරසිලි මූලයන් බෞද්ධ කලාවේ ජනප්‍රිය භාවිතයක් බවට පත් වූයේ ඇයි ද යන්න සුවිශේෂ ගැටලුවක් ලෙස හඳුනාගත හැකි ය. එබැවින් මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වන්නේ යටත් විජිතකරණය නිසා බෞද්ධ සැරසිලි කලාවේ සිදු වූ වෙනස්කම් හඳුනා-ගැනීම සහ එම වෙනස්කම් ඇති වීමට බල පෑ හේතු සාධක අවබෝධ කරගැනීම යි.

මෙම අධ්‍යයනය සඳහා බස්නාහිර සහ දකුණු ප්‍රදේශ කේන්ද්‍රීය ව බෞද්ධ විහාරස්ථාන 25 ක පර්යේෂණ නියැදියක් තෝරාගන්නා ලදි. ස්ථානීය ගවේෂණ, පන්සල් වාර්තා පිරික්සීම, යටත්විජිත කාල සීමාවට අයත් ලේඛන-වාර්තා සටහන් අධ්‍යයනය සහ ප්‍රස්තුත කාරණාවට අදාළ ශාස්ත්‍රීය පර්යේෂණ ඇසුරෙන් දත්ත රැස් කිරීම සිදු විය. උඩරට බෞද්ධ කලාවේ නැතහොත් මධ්‍යම මහනුවර ගුරුකුලයේ ප්‍රචලිත ව තුබූ සැරසිලි මෝස්තර සමග තෝරාගත් නියැදියේ සැරසිලි මොස්තර සංසන්දනාත්මක දෘශ්‍ය-විශ්ලේෂණයකට බඳුන් කරන ලදි.

මෙහි දී පැහැදිලිව හඳුනාගත හැකි කරුණක් වූයේ සාම්ප්‍රදායික උඩරට බෞද්ධ කලාවේ නැතහොත් මධ්‍යම මහනුවර ගුරුකුලයේ ප්‍රචලිත ව තුබූ සැරසිලි මෝස්තර රටාවන්හි කැපී පෙනෙන වෙනස්කම් ගණනාවක් යටත් විජිතකරණය හේතු කොටගෙන පහතරට ප්‍රදේශයන්හි දී සිදු ව ඇති බව යි. නෙලුම්මල්, පලාපෙති, සපුමල්, ලියවැල්, කඩුපුල් මල් ආදි සාම්ප්‍රදායික මෝස්තර රටා යටපත් කර මිදි පොකුරු, රෝස මල්, මිදිවැල්, සහ වෙනත් රොකෝකෝ සහ බැරොක ආදී අපරදිග ආභාසය ලැබූ මෝස්තර රටා රැසක් බෞද්ධ සැරසිලි කලාවේ අධිකාරිත්වය තහවුරු කරගත් ආකාරය වෙරළබඩ තීරයේ විහාර සැරසිලි මොස්තරවලින් පැහැදිලි ව පෙනේ. උදාහරණ ලෙස, මිදිවැල් සහ රෝස මල් පහතරට කෙතරම් ජනප්‍රිය වී ද යත් කතලුව පූර්වාරාමයේ සාම්ප්‍රදායික මකර තොරණෙහි පවා යොදා ඇත්තේ මිදි පොකුරු සහ රෝස මල් මෝස්තරයකි. කරගම්පිටිය සුබෝධාරාමයේ ද පිළිම ගෙයට ඇතුළු වන දොරටු වටා මිදිවැල් සහ මිදි පොකුරු මෝස්තරයක් යොදා තිබේ. සාම්ප්‍රදායික නෙලුම් මල් සිවිලිම වෙනුවට සම්පූර්ණයෙන් ම රෝසමල් මොස්තරයකින් සැරසූ සිවිලිමක් දොඩම්දූව කුමාර කන්ද විහාරයේ දැකිය හැකි ය. පානදුර රන්කොත් විහාරය, සපුගොඩ ශ්‍රී මහා විහාරය, දොඩම්දූව ශෛලබිම්බාරාමය, සමුද්‍රගිරි විහාරය, කරගම්පිටිය සුබෝධාරාමය, කතලුව පූර්වාරාමය, දොඩම්දූව කුමාර කන්ද විහාරය, තෙල්වත්ත විහාරය, තොටගමුව සුභද්‍රාරාමය ආදී පහතරට විහාරස්ථාන රාශියක සිතුවම්වල පසුබිම් පිරවීමේ මොස්තර සහ තීරු සැරසිලි ලෙස රෝසමල්, මිදි වැල් සහ රොකෝකෝ ශෛලියේ පත්‍ර රටා යොදා තිබේ.

බුද්ධ ප්‍රතිමා වටා සැරසිලිකරණය සඳහා ද යුරෝපීය සැරසිලි භාවිත වූ අවස්ථා රැසක් පහතරට බෞද්ධ විහාරස්ථානවලින් හමු වේ. එබඳු ඉතා වැදගත් අවස්ථාවක් ලෙස කොටහේන දීපදුත්තරාමයේ හිඳි බුදු පිළිමය වටා ඇති විසල් යුරෝපීය සැරසිලිමය කැටයම දැක්විය හැකි ය. මෙය යුරෝපීය කුළුණු රටා, පෙඩිමන්ට් ආකෘති, රොකෝකෝ සහ බැරොක ආකෘතිවලින් බිඳී ආ සැරසිලි මෝස්තර සහිත යුරෝපීය පන්නයේ වාදකයින් සහ සිංහ-කඟවේණ රූකමින් සමන්විත සංකීර්ණ සැරසිලි ආකෘතියකි. බුදු පිළිමය මෙන් කිහිප ගුණයක් විශාල මෙමගින් මහේශාඛ්‍ය පෙනුමක් ප්‍රතිමා අවකාශයට ලැබී තිබේ.

මීට අමතර ව බෞද්ධ විහාරස්ථාන විශාල සංඛ්‍යාවක ජනේල සහ දොරවල් සැරසීමට අපරදිග ශාක පත්‍ර සහ මල් සැරසිලිවලින් සකස් වූ මෝස්තර රටා සුලභ ව යෙදී තිබේ. අඹගහපිටිය මූල මහ විහාරය, කරගම්පිටිය සුබෝධාරාමය, පානදුර රන්කොත් විහාරය ආදී විහාරස්ථානවල ජනේල සහ දොරවල් වා-කවුළු කැටයම් මෙයට නිදසුන් වේ. එසේ ම ද්වාරමණ්ඩපය සැරසිලිවල ද අපරදිග ජ්‍යාමිතික රූපී රටා හමු වන අතර, අලුත්ගම කන්දේ විහාරයේ සහ පානදුර රන්කොත් විහාරයේ ද්වාරමණ්ඩපයන්හි අර්ධ උන්නත සැරසිලි කැටයම් මෙයට සාක්ෂි සපයයි.

නව සත්ත්ව රූප බෞද්ධ සැරසිලි කලාවේ ස්ථාපිත වීම සහ එතෙක් ශෛලිගත ව භාවිත වූ සත්ත්ව රූප වික්ටෝරියානු ස්වාභාවිකත්වයට අනුරූපී ව වෙනස් වීම යටත්විජිතකරණය නිසා බෞද්ධ සැරසිලි කලාවේ සිදු වූ තවත් වැදගත් වෙනසකි. පූර්ව-යටත්විජිත අවධියේ හමු නොවූ කඟවේණාගේ රුව යටත් විජිත බෞද්ධ සැරසිලි කලාවේ ජනප්‍රිය රූපයක් බවට පත් විය. මෙම සත්ත්වයා බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාඤ්ඡනයේ නිල රුවක් වීම එහි ජනප්‍රියත්වයට බල පෑ ප්‍රධාන කරුණුවලින් එකක් බව පෙනේ. කොටහේන දීපදුත්තරාමයේ සැතපෙන පිළිමගෙයට ඇති පිවිසුම් ද්වාරයේ විශාල මූර්ති යුගලය සහ කෝට්ටේ රජමහා විහාරයේ ද දොරටු දෙපස කඟවේණ රූප එය සැරසිලිමය අරුතින් භාවිත වූ අවස්ථාවන්ට නිදසුන් වේ.

කඟවේණා ගේ රුව මෙන් ම සාම්ප්‍රදායික සිංහ රූපය ද පහතරට විහාරස්ථානවල සැරසිලිවල යෙදී ඇත්තේ එහි උඩරට භාවිත ශෛලීගත සම්ප්‍රදායෙන් මිදී වික්ටෝරියානු ස්වාභාවිකවාදී වින්‍යාසයන් අනුගමනය කරමිනි. පානදුර රන්කොත් විහාරයේ පිටත බිත්තිවල මෙබඳු සිංහරූප සහිත සැරසිලි අංග දැකිය හැකි ය. සිංහරූපයේ තුබූ නරසිංහ, ගජසිංහ වැනි ශෛලීගත විභේදනයෝ පහතරට විහාරස්ථානවලින් අතුරුදහන් වූහ. එසේ ම මධ්‍යම මහනුවර කලාවේ තුබූ හංසයා, කිඳුරා, සැරපෙන්දියා, භේරුණ්ඩ පක්ෂියා, ගුරුළා වැනි සත්ත්ව රූප පහතරට සැරසිලිවලින් ගිලිහිණි. 19 වන සියවසෙහි අග භාගයේ දී කරන ලද විහාර වූ පානදුර රන්කොත් විහාරය, සපුගොඩ ශ්‍රී මහා විහාරය ආදියෙහි අභ්‍යන්තර බිත්තිවල අවකාශය පිරවීම සඳහා ස්වාභාවිකරූපී ව අඳින ලද සමනලයින්, ලේනුන්, පැණි කුරුල්ලන් ආදී නව සත්ත්ව හා පක්ෂි රූප භාවිතා කර තිබේ. ලන්දේසි සහ බ්‍රිතාන්‍ය සිත්තරුන් විසින් අඳින ලද සත්ත්ව රූපවල ලක්ෂණ අනුගමනය කිරීමට බොහෝ විහාර සිත්තරුන් ද උත්සාහ ගත් ආකාරය මෙම සිතුවම්වල දැකිය හැකි වේ.

සැරසිලි අංගයක් ලෙස යුරෝපීය ලාඤ්ඡන යෙදීම පහත රට බෞද්ධ විහාරස්ථානවල දක්නට ලැබෙන තවත් බෙහෙවින් ජනප්‍රිය ලක්ෂණයකි. සැරසිලිමය භාවිතයට අමතර ව

මේවායේ යටත්විජිත පාලනයට විරුද්ධ නොවන බව හැඟවීමේ දේශපාලනික අර්ථයක් ද විය. මෙම ලාඤ්ඡන බොහෝවක් යොදා ඇත්තේ විහාරස්ථානයන්හි ප්‍රධාන දොරටු, ද්වාර මණ්ඩප, ප්‍රවේශ මණ්ඩප ආදී වඩාත් හොඳින් ඒවායේ අලංකාරත්වය අවධාරණය වී පෙනෙන ස්ථානවල වීම විශේෂත්වයකි. කතලුව පූර්වාරාමය, කරගම්පිටිය සුබෝධාරාමය, කෝට්ටේ රජමහා විහාරය, සපුගොඩ ශ්‍රී මහා විහාරය, දොඩම්දූව ශෛලබිම්බාරාමය, අලුත්ගම කන්දේ විහාරය, තොටගමුව සුභද්‍රාරාමය, සපුගස්කන්ද පුරාණ විහාරය ආදිය බ්‍රිතාන්‍ය ලාඤ්ඡනවලින් සරසන ලද පහතරට විහාරස්ථානවලින් කිහිපයකි. විහාරස්ථානවල ද්වාරමණ්පයන්හි අර්ධ-උන්නත මූර්තිමය සැරසිලි ලෙස නෙළන ලද බ්‍රිතාන්‍ය ලාඤ්ඡන කිහිපයක් ම අලුත්ගම කන්දේ විහාරයේ, දොඩම්දූව ශෛලබිම්බාරාමයේ සහ දේවපතිරාජ පිරිවෙණෙහි දක්නට ලැබේ. මෙයට අමතර ව යුරෝපීය ආභාසය සහිත ව කළ සිංහරූප සහිත ද්වාර මණ්ඩප සැරසිලි පානදුර රන්කොත් විහාරයේ සහ අමරපුර චූලගණ්ඨි නිකායේ මූලස්ථාන විහාරයේ පැරණි බුදු මැදුරේ දක්නට ලැබේ. මේවා යටත්විජිත ලාඤ්ඡන නොවුව ද එහි ආකෘතිය සැකසී ඇත්තේ යටත්විජිත ලාඤ්ජන ඇසුරෙන් බව පෙනේ.

යුරෝපීය අනංග රූපයේ ආභාසය සහිත ළදරු රූප සැරසිලි අංගයක් ලෙස භාවිතයට පැමිණීම යටත්විජිතකරණය නිසා බෞද්ධ සැරසිලි කලාවේ ඇති වූ තවත් ප්‍රතිඵලයකි. පානදුර රන්කොත් විහාරයේ ඉදිරිපස දකුණු ප්‍රවේශයේ ඉහළ සිංහයන් කැටුව සිටින එබඳු රුවක් ඇත. මීට අමතර ව සපුගොඩ ශ්‍රී මහා විහාරයේ සහ මුල්ගිරිගල රජමහා විහාරයේ සිතුවම්වල අවකාශ පිරවීමේ රූපයක් ලෙස එබඳු ළදරු ස්වරූපයේ රූප යෙදී තිබේ. එහෙත් යුරෝපීය කලාවේ අනඟ රුවට භාවිත වූ නග්නත්වය සහ පියාපත් දේශීය ශිල්පීන් භාවිත කර නැත.

පිඟන් ගඩොල් සහ මොසෙක් සැරසිලි කලාව ජනප්‍රිය වීම ද යටත්විජිත කාලයේ දී සිදු වූ තවත් ලක්ෂණයකි. කරගම්පිටිය සුබෝධාරාමයේ පිළිමගෙයි බිමෙහි මෙසේ පිඟන් කැබලි අල්ලා කරන ලද අලංකාර සැරසිලි මෝස්තර ගණනාවක් හඳුනාගත හැකි ය. මෙහි දී කුඩා ප්‍රමාණයේ පිඟන් කැබලි විවිධ හැඩතල සහ රටා මැවෙන පරිදි පොළොවට ඔබ්බවනු ලැබේ. පානදුර රන්කොත් විහාරයේ සණ්ටාර කුළුණෙහි ද මෙබඳු පිඟන් කැබලිවලින් කළ සැරසිල්ලක් දැකිය හැකි ය.

ලතින් අක්ෂර සහිත පාඨයන් සැරසිලිමය අරුතින් අන්තර්ගත වීම ද යටත් විජිත සමයේ බෞද්ධ විහාරස්ථානයන්හි දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයකි. මෙම පාඨයන් ගෙන් බහුතරයක් ගොඩනැගිලි හැඳින්වීම වෙනුවෙන් කරන ලද නාම පුවරුමය සැරසිල්ලක ස්වරූපයක් දරයි. නිදසුනක් ලෙස කෝට්ටේ රජමහා විහාරයේ බුදු මැදුරට පිවිසෙන දොරටුවට ඉහළින් JAYAWARDHANAKOTTE MAHAVIHARE යන විහාර නාමය ඉංග්‍රීසි බසින් යොදා තිබීම දැක්විය හැකි ය. අළුත්ගම කන්දේ විහාරයේ ද මෙබඳු වැකියක් වන TILOKANATHA DHATUNIHTAИ යන්න යොදා තිබේ. මීට අමතරව බෞද්ධ බිතු සිතුවම්හි ද ඉංග්‍රීසි පාඨයන් යෙදූ අවස්ථා ගණනාවක් ම හමු වේ. නිදසුනක් ලෙස සපුගොඩ ශ්‍රී මහා විහාරයේ බුද්ධ චරිතයට අදාළ සිතුවම් අතර මාළිගයක සැරසිල්ලක් ලෙස එහි පෙඩිමන්ට් කොටස මත A KING HOUSE යන්න ලියා තිබේ. අම්බලන්ගොඩ සුනන්දාරාමයේ ඇති බ්‍රිතාන්‍ය ලාඤ්ඡන මධ්‍යයේ ඇති BUDDHIST ERA 2430 නමැති පාඨය දැකිය හැක.

වර්ණ ගැන්වූ වීදුරු සැරසිලි අංගයක් ලෙස විහාර සැරසිලිකරණට පැමිණියේ යටත් විජිතකරණය හේතු කොටගෙන ය. ක්‍රිස්තියානි දෙව් මැදුරු තරම් සංකීර්ණ ස්වරූපයකින් භාවිත නොවුණ ද සරල හැඩ රටා මතු වන පරිදි රංජිත වීදුරු කැබලි පහතරට විහාරවල ජනෙල්වලට ඔබ්බවා තිබේ. දොඩම්දූව ශෛලබිම්බාරාමය, වැවුරුකන්නල විහාරය, දොඩම්දූව කුමාර කන්ද විහාරය ආදි ස්ථානයන්හි මෙම භාවිතයන් හඳුනාගත හැකි ය.

ගෘහ නිර්මාණාත්මක වශයෙන් විහාරස්ථාන සැලසුම් සහ අලංකරණවල අපරදිග ලක්ෂණ ප්‍රකටවීම යටත් විජිත සමයේ විහාරවල තවත් කැපී පෙනෙන ලක්ෂණයකි. පහතරට විහාරස්ථාන බහුතරය ටස්කන් ආදී අපරදිග කුළුණු, රෝමානු ආරුක්කු, තුඩු ආරුක්කු, ගේබල, පෙඩිමන්ට්, ආලින්ද, පෝටිකෝ, ද්වාර මණ්ඩප, බටහිර ක්‍රමයේ පනේල-දොරවල් සහ ජනේල ආදී අංගයන්ගෙන් සකස් වූ ආකෘති වේ. මෙම විහාරවල බදාමයෙන් කළ බාහිර සැරසිලි රටා ද බොහෝවක් ලන්දේසින් සහ ඉංග්‍රීසින් නිසා වෙරළබඩ තීරයේ පැතිරී ගිය නිර්මාණාංගවලින් සකස් වූ බව පෙනේ. අලුත්ගම කන්දේ විහාරය, අමරපුර චූලගණ්ඨි නිකායේ මූලස්ථාන විහාරය, පානදුර රන්කොත් විහාරය, දොඩම්දූව කුමාර කන්ද විහාරය, වස්කඩුව ධර්මශාලා විහාරය ආදියෙහි ආකෘති සහ බාහිර සැරසිලි රටා පැහැදිලි ව ම අපරදිග ආභාසය පෙන්නුම් කරයි.

ඉහතින් විස්තර කෙරුණු අපරදිග ආභාසය සහිත සැරසිලි හමු වන විහාරස්ථාන බහුතරය පහතරට ප්‍රදේශයන්හි ඉදි වූයේ 19 වන සියවසෙහි දී ය. මෙම අවධිය යුරෝපීය යටත් විජිතකරණයත්, අපරදිග දැනුමත් ශ්‍රී ලාංකේය සමාජ අවකාශයෙහි ප්‍රබල බලපෑමක් ඇති කර තිබූ කාල වකවානුවක් විය. මෙකල විහාර කර්මාන්ත සඳහා දායක වූ පහතරට සිත්තරුන් පිළිබඳ විමසීමේ දී ඔවුන් බහුතරයක ගේ ශිල්පීය කුල ක්‍රමය බිඳ වැටී සාම්ප්‍රදායික ශිල්ප ධර්ම පුහුණුව ද අහෝසි වී තිබිණි (Jayathilaka 2008: 217-232). මධ්‍යම මහනුවර ශෛලියේ උඩරට සිත්තරුන් ගේ මූලික අධ්‍යයනයන් වූ වකදෙක-තිරිගිතලය කේන්ද්‍රීය සාම්ප්‍රදායික පුහුණුව පහතරට දී ඒ අයුරින්ම ක්‍රියාත්මක නො වී ය. යටත්විජිතකරණය නිසා පහතරට සිත්තරුන් දුටුවේ උඩරට සිත්තරුන් දුටු සාම්ප්‍රදායික සැරසිලි සහිත සමාජ අවකාශය නො ව යුරෝපීය පාලක රුචිකත්ව අනුව සැකසුණ සැරසිලි මොස්තර, ඇඳුම් විලාසිතා, ගොඩනැගිලි ආදිය සහිත සමාජ අවකාශයකි. මෙම යටත්විජිතකරණය නිසා ගොඩනැගුණු සමාජ අවකාශය බෞද්ධ සිතුවම් කලාවට පමණක් නොව ගෘහනිර්මාණ කලාවට ද ප්‍රබල බලපෑමක් සිදු කළේ ය.

19 වන සියවසේ දී සිංහල රාජ්‍ය අනුග්‍රහය පහතරට සිත්තරුන්ට නොලැබීම හේතු කොටගෙන සිත්තරුන් සම්බන්ධීකරණය වූ කොට්ටල්බද්ද නම් පාලන ව්‍යුහය අක්‍රිය විය. මේ නිසා ඇතැම් සිත්තරුන් ක්‍රීඩාගාර ලාක්ෂන ඇඳීම වැනි ආගමික නොවූ සැරසිලිමය කාර්යයන්හි ද නියැළි බව හඳුනාගත හැකි ය (බ්‍රෝහියර් 1999: 251,252; Bandaranayake 1986: 20; හපුආරච්චි 1981: 84-85). එසේ ම යටත්විජිත කාල පරිච්ඡේදයේ දී බටහිර සිත්තරුන් ගණනාවක් ම ලංකාවේ විවිධ නිර්මාණ කටයුතුවල යෙදී සිටි අතර, ඔවුන් නිසා ප්‍රචලිත වූ කලා ව්‍යාපාර සහ සැරසිලි ද පහතරට සිත්තරුන්ට බල පා ඇති බව පෙනේ (Dharmasiri : 1990).

උඩරට රාජ්‍ය අනුග්‍රහය පහතරට පන්සල්වලට නොලැබී යාමට සමගාමී ව උඩරට ප්‍රභූ අනුග්‍රාහකත්වයට වඩා වෙනස් වූ නව අනුග්‍රාහක පන්තියක් පහතරට ප්‍රදේශවලින් බිහි විය. කොම්ප්‍රදෝරු පාන්තිකයන් ලෙස හඳුන්වන මෙම අනුග්‍රාහක පන්තියේ බහුතරය ක්‍රිස්තියාන ලබ්ධික මිෂනාරි අධ්‍යාපනය ලැබූ යුරෝපයී රුචිකත්වයනට නැඹුරු කණ්ඩායමක් විය (Gunawardena 1958 :87,88, de Silva 1981: 335, 336, Malalgoda 1976: 31-45). ඔවුහු බොහෝ දෙනෙක් යටත්විජිත රජයේ මුදලි, මුහන්දිරම් වැනි තනතුරු දැරූහ. කොම්ප්‍රදෝරු පාන්තිකයින් පන්සල්වලට අනුග්‍රාහකත්වය දැක්වීමෙන් අපේක්ෂා කරන ලද්දේ පහතරට ප්‍රදේශවල සාමාන්‍ය ජනයා අතර සමාජමය වශයෙන් පිළිගැනීමක් ඇති කරගැනීම, තම බලය පැතිරවීම සහ භික්ෂූන් දිනාගැනීම යි. මෙසේ අපරදිග රුචිකත්ව සහිත නව අනුග්‍රාහක පිරිස නිසා යුරෝපීය සැරසිලි මොස්තර භාවිතයට විහාර සිත්තරුන් තුළ පෙළඹීමක් ඇති කෙරිණි (Jayathilaka 2009: 281-291).

යටත්විජිත අධ්‍යාපනය හේතු කොටගෙන ක්‍රිස්තියානි ආගම, යුරෝපීය භාෂාවන් මෙන් ම අපරදිග කලාවන් ඇතුළු බටහිර හර පද්ධතීන් පහතරට ව්‍යාප්ත වූ අතර එමගින් විශාල සමාජ විපර්යාසයක් ද සිදු විය (දොන් පීටර් 1969: 269). අධ්‍යාපනය මගින් බටහිර සංකල්ප හා අදහස් අගය කිරීමට, අනුකරණය කිරීමට ස්වදේශිකයන් පෙළඹවූ බැව් පෙනේ. යටත්විජිත පරිපාලනයේ තනතුරු දැරීම සඳහා ස්වදේශිකයන්ට යුරෝපීය භාෂා හැකියාව අත්‍යවශ්‍ය සාධකයක් විය. පහතරට නායක භික්ෂූන් අතර පවා මිෂනාරි අධ්‍යාපනය ලබා සිටි ක්‍රියාකාරී භික්ෂූහු වූහ. (ධර්මබන්දු 1949: 1-97). මෙකරුණ ද පහතරට විහාරස්ථානවල අපරදිග මෝස්තර සැරසිලි භාවිත කිරීමට නිර්මාණ ශිල්පීන්ට ආධාරක පරිසරයක් බිහි කිරීමට උපකාරී විය.

යටත්විජිත භූමි සීමාවන්හි සමාජ-දේශපාලනික බලය යුරෝපීයනට හිමි ව තුබූ බැවින් එම අවකාශයෙහි සිටි සියලු ම කොටස් කෙරෙහි අපරදිග දැනුම බල පැවැත්විණි. යුරෝපීය පරිපාලන නීති රීති, ඉංග්‍රීසි අධ්‍යාපනය, ක්‍රිස්තියානි ආගම ආදියෙන් සැකසී යටත් විජිත පාලන ව්‍යුහයට ස්වදේශිකයින් අවශ්‍යයෙන් ම අවනත විය යුතු විය. එබඳු පරිසරයක අනුභාවය පැවැත්වූ යුරෝ-කේන්ද්‍රීය දැනුම මගින් යුරෝපීය අනන්‍යතාවන් උත්කෘෂ්ටත්වයට නැංවූ අතර ස්වදේශීය අනන්‍යතාවන් නොසලකා හැරීමක් ද සිදු විය.

පහතරට නව නිකායන්හි පැන නැගීම ද බෞද්ධ සැරසිලි කලාවේ ස්වරූපය සකස් වීමට හේතු වූ කරුණක් විය. එය උඩරට බෞද්ධ සම්ප්‍රදායන් ගෙන් මිදී ගත් නව ආගමික අවකාශයක් පහතරට ප්‍රදේශයන්හි බිහි කිරීමට හේතු විය. උඩරට බෞද්ධ අධිකාරිය පහතරට උපසම්පදාව 1768 දී ප්‍රතික්ෂේප කිරීමෙන් පසු අමරපුර, කල්‍යාණිවංශ, රාමඤ්ඤ ආදී නව නිකාය පහත රට පැන නැගුණි (Malalgoda 1976). එමගින් තව දුරටත් උඩරට බෞද්ධ අධිකාරිත්වය මත රඳා නොපවතින නව බෞද්ධ ආකෘතියක් පහතරට ප්‍රදේශවල ඇති වීම ඉතා වැදගත් කරුණකි. මෙම නව නිකායික පන්සල්වල ආකෘතීන් උඩරට සාම්ප්‍රදායික විහාරවලින් වෙනස් වූ අතර යටත්විජිත ගොඩනැගිලිවලින් ගත් ලක්ෂණ විශාල ප්‍රමාණයක් ඒවායේ විය. මෙය ද බෞද්ධ සැරසිලි කලාවේ ස්වරූපය කෙරෙහි බල පෑ තීරණාත්මක කරුණක් විය.

යටත්විජිතකරණය බෞද්ධාගමට එදිරි ව පිහිටි ක්‍රියාදාමයක් වූ නමුත් තීරණාත්මක අවස්ථා කිහිපයක දී ලන්දේසිහු හා ඉංග්‍රීසිහු බෞද්ධාගම විෂයෙහි මිත්‍රශීලී ව කටයුතු කළෝ ය. නිදසුනක් ලෙස, 1753 දී සියම් උපසම්පදාව පිහිටුවීමට උඩරට රජුට ලන්දේසීන් නැව් සහ නවාතැන් පහසුකම් සැලසීම එබඳු එක් කටයුත්තකි (Malalgoda 1976: 61). එසේ ම පහතරට වැසියා ගේ පාක්ෂිකත්වය දිනාගැනීමේ අරමුණින් ලන්දේසීන් මුල්ගිරිගල, කැලණිය, රිදී විහාරය ආදී ස්ථාන කිහිපයකට ම ද්‍රව්‍යමය අනුග්‍රහ දක්වා ඇත (Malalgaoa, 1976:83; ද සිල්වා 2000: 71). ඇතැම් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයින් පහතරට විහාරස්ථානයන්ට හා භික්ෂූන්ට දීමනා හා උපකාර කළ අවස්ථා හමු වන අතර පහතරට සංඝනායක කරතොට හිමියන් එබඳු එක් භික්ෂුවකි (පඤ්ඤාලෝක 2002 : 354, වීරසූරිය 1972: 43, ධර්මබන්දු 1949: 17-18). මෙබඳු කටයුතු පහතරට බෞද්ධ අධිකාරිය ඇතැම් අවස්ථාවල දී යුරෝපීයයන් කෙරෙහි යහපත් ආකල්පයක් දැක්වීමට හේතු වූ බව සිතිය හැකි ය. පහතරට විහාරස්ථානවල බ්‍රිතාන්‍ය ලාඤ්ඡනය ආදිය අලංකරණ අංග ලෙස එක් වීම මෙබඳු දේශපාලනික පසුබිමක සිදු වූවක් බව පෙනේ.

ඉහත සාකච්ඡා කළ කරුණු අනුව යටත්විජිතකරණය නිසා සැලකිය යුතු බලපෑමක් බෞද්ධ සැරසිලි කලාවේ සිදු වූ බව හඳුනාගත හැකි ය. මේ අතුරින් වැඩි ම බලපෑමකට ලක් වූයේ ඍජු ව ම යුරෝපීය පාලනයට දිගු කලක් නිරාවරණය වී තුබූ පහතරට නැතහොත් වෙරළබඩ කලාපයේ විහාරස්ථානවල සැරසිලි මෝස්තරයන් ය. දකුණු ගුරුකුලයේ ව්‍යාප්ත වීම හේතු කොටගෙන මෙම අපරදිග සැරසිලි ලක්ෂණ උඩරට ප්‍රදේශයේ විහාරස්ථානවලට ද පැතිරුණු අතර හිඳගල, මාලගම්මන ආදී විහාරස්ථානවල 19 වන සියවසට අයත් සිතුවම් සහ සැරසිලි මෙයට නිදසුන් ය.

බෞද්ධ සැරසිලි කලාවේ ස්වරූපය වෙනස් වීමට හේතු වූ කරුණු ගණනාවක් ඉහතින් අවධාරණය කෙරිණි. පහතරට විහාර සැලසුම්කරුවන් සහ කලා ශිල්පීන් ජීවත් වූයේ යුරෝපීයයනට සමාජ-දේශපාලනික අධිකාරිත්වය හිමි වූ සමාජ අවකාශයක වීම නිසා උඩරට දී ක්‍රියාත්මක වූ ශිල්ප ධර්ම පද්ධති සහ භාවිතයන් පහතරට දී ක්‍රියාත්මක නොවීම එයින් වැදගත් කරුණකි. යටත් විජිතකාරකයන් අපරදිග රුචිකත්ව සහිත කලාවන් සහ සැරසිලි අංග හැම විට ම උත්කෘෂ්ටත්වයෙන් සැලකූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය සැරසිලි අංග නොසලකා හැරීම ද සිදු විය. එසේ ම උඩරට රාජධානිය බිඳවැටී කොට්ටල්බද්ද නමැති ශිල්පීන් විෂයෙහි ක්‍රියාත්මක වූ ආයතනය අක්‍රිය විය. එයට සමගාමී ව විහාරාරාම ඉදිකිරීම සඳහා සිංහල රාජ්‍ය අනුග්‍රහය වෙනුවට යටත් විජිත පාලනයේ තනතුරු දැරූ කොම්ප්‍රදෝරු පාන්තික නව අනුග්‍රාහක පන්තියක් ඉදිරිපත් වූ අතර කොම්ප්‍රදෝරු පාන්තිකයන් ගෙන් බහුතරය මිෂනාරි අධ්‍යාපනය ලැබූ යුරෝපීය හර පද්ධතීන් ප්‍රිය කළ පිරිසක් වූ බව ඔවුන් ගේ නිවාස සහ නිවාස සැරසිලිවලින් තහවුරු වේ. පහත රට ඇතැම් විහාර ශිල්පීන් ද යටත් විජිත ගොඩනැගිලි ආදිය තැනීමට මෙන් ම විවිධ සැරසිලි කටයුතුවලට වක්‍ර ව සම්බන්ධ වූ බවට සාධක හමු වේ. යටත්විජිතකරණය නිසා අපරදිග සැරසිලි සහිත ගොඩනැගිලි බහුල ව ඉදිවීම, විදේශීය සිත්තරුන් පැමිණීම, විවිධ අපරදිග ව්‍යවහාරික කලා පැතිරී යාම ආදිය ද ස්වදේශීය සැරසිලි විෂයෙහි ප්‍රබල බලපෑමක් ඇති කෙරිණි. යටත්විජිත අවකාශය තුළ සිදු වූ මෙම වෙනස්කම් බෞද්ධ සැරසිලි කලාවේ ස්වරූපය වෙනස් වීමට හේතු වූ බව හඳුනාගත හැකි ය.

## ආශ්‍රේය ග්‍රන්ථ


Abeysinghe, T.B.H. (1995). *History of Sri Lanka : from c1500 to c 1800*. K .M. de Silva (Ed.). (II, pp 124-133). Peradeniya: University of Peradeniya.

Bandaranayake, S. (1986). *Rock and Wall Painting of Sri Lanka*. Colombo: Lake House Book Shop.

De Silva, C.R. (1995) *History of Sri Lanka : from c1500 to c 1800*. K .M. de Silva (Ed.). (II, pp 87-93). Peradeniya: University of Peradeniya.

De Silva, K.M. (1981). *A History of Sri Lanka*. Oxford: Oxford University Press.

Dharmasiri, A. (1990). *Chitra Kalawa, Nutana Samaya.Puravidya Shata Sanwathra Kalapaya*. Colombo: Department of Archeology.

Gunawardena, K.W. (1958). *The Foundations of Dutch Power in Ceylon 1638-1658*. Amsterdam.

Jayathilaka, J.A.V.N. (2008). Artisans and their practice of construction and decoration of Buddhist Monasteries in the low-country of colonial Ceylon (1750-1900). *Journal of the Faculty of Humanities*, University of Kelaniya. (VIII, pp 217-232). Kelaniya: Faculty of Humanities.

Jayathilaka. J.A.V.N. (2009). Buddhist Patrons in late Colonial Ceylon; Mudliyars and their Influence on Temple Construction. *Journal of the Faculty of Humanities,* University of Kelaniya (X, pp 281-293). Kelaniya: Faculty of Humanities.

Kotalawala. (1995). *History of Sri Lanka: from c1500 to c 1800*. K .M. de Silva (Ed.). (II, pp 240). Peradeniya : University of Peradeniya.

Malalgoda, K. (1976). *Buddhism in Sinhalese Society 1750 – 1900:A Study of Religious Revival and Change*. California: California University Press.

ද සිල්වා, එම්. යූ. (2000). පංච මහා වාදයේ පසුබිම. (:දයා එදිරිසිංහඃ ප්‍රධාන සංස්.) තක්සලාවක අභිමානය, පානදුරඃ සද්ධර්මාකර ආදි ශිෂ්‍ය පදනම.

දොන් පීටර්, ඩබ්. එල්. ඒ. (1969). ලංකාවේ අධ්‍යාපනය සියවස ප්‍රකාශනය. කොළඹඃ අධ්‍යාපනය සහ සංස්කෘතික අමාත්‍යාංශය.

ධර්මබන්ධු, ටී . ඇස්. (1949). අපේ සිංහල වීරයෝ. කොළඹ: ඇම් ඩී ගුණසේන සහ සමාගම.

පඤ්ඤාලෝක හිමි එම්. (2002). ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

බෞද්ධ තොරතුරු පරීක්ෂක වාර්තාව (1956). බලංගොඩ: ධර්ම විජය මුද්‍රණාලය.

බ්‍රෝහියර්, ආර්. එල්. (1999) බ්‍රෝහියර් දුටු ලංකාව. පරි: හේවාවසම්, අභය. කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

වනරතනහිමි, කඹුරුපිටියේ. (1994). මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය. ඌරාපොල: තිහගොඩ. ශ්‍රී රෝහණ සංඝ සභා මූලස්ථානය.

වීරසූරිය, ජී. පී. ඩී. එස්. (1972). මාතර සාහිත්‍ය වංශය. කොළඹ: ඇම් ඩී ගුණසේන සහ සමාගම.

හපුආරච්චි, ඩී. වී. (1981). සිංහල නාට්‍ය ඉතිහාසය 1860-1911. කොළඹ: සී/ස ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම